*සැ. යු.* - මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2021 වර්ෂය සඳහා ගාල්ල - බලපිටිය දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,217- 2021 පෙබරවාරි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2021.02.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස - ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් .... ... ... ... | — |
| අවසාන නියෝග .... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරී විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 66 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම .... ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 71 |


*සැ. යු.* -(i) වර්ල්ඩ් ලයිෆ් ලයින් යෝගා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 පෙබරවාරි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) වයිට් රෝස් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2021 පෙබරවාරි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 මාර්තු මස 19 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 මාර්තු මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

ගංගානි ලියනගේ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

65-B 82208 - 353 (2021/02)
E -1

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් මාදුවගේ යුරේෂ් නිශාන්ත වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1986.04.28 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතලේ/ප්‍ර/7066 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ගලේවෙල, යටිගල්පොත් පදිංචි චන්ද්‍රසේකර මුදියන්සේලාගේ පොඩි අප්පුහාමි වෙත ප්‍රදානය කොට මාතලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ය/09/90 යටතේ 1990.01.31 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.03.19 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දපල්ල කෝරළේ වලස්වැව, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ යටිගල්පොත්ත නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා සාදනු ලැබූ ඔහු භාරයේ ඇති අංක ග. සි. 403 දරන පිඹුරෙහි අංක 621 දරන බිම් කැබැල්ල ලෙස පෙන්නුම් කොට ඇති ප්‍රමාණයෙන් අක්කර 01, පර්චස් 13ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම. යටිගල්පොත්ත ජනපදය.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 622 , |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 623 , |
| *දකුණට* | : | කැබලි අංක 649 , |
| *බස්නාහිරට* | : | කැබලි අංක 620 . |

එම්. යූ. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
ගලේවෙල.

02-688/1

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, මාතලේ දිස්ත්‍රික්කයේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් ඩී. ආර්. කේ. හෙන්නායක වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1982.05.24 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතලේ/ප්‍ර/588 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 62, 64, දූල්ලැව, වාලවෙල පදිංචි ඇම්. ඇල්. ජොහාරා බීබී මහත්මිය වෙත ප්‍රදානය කොට මාතලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක දූ/5/438 යටතේ 1982.10.04 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.03.19 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

#### උපලේඛනය

මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අස්ගිරි උඩසිය පත්තුවේ දූල්ලැව, ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ දූල්ලැව නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, මාතලේ මැනුම් අධිකාරී භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක I 15/36 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි මු. පි. මා. 110 කට්ටි කැඩීමේ පිඹුරේ අංක 62 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් විසි පහක් හා 64 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තා වූ පර්චස් 16 ක විශාලත්වය ඇත්තා වූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම දූල්ලැව 1 ජනපදය.

*කැබලි අංක 62*

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඇල , |
| *නැගෙනහිරට* | : | පාර , |
| *දකුණට* | : | කැබලි අංක 61 හා පාර, |
| *බස්නාහිරට* | : | කැබලි අංක 61 හා පාර. |

*කැබලි අංක 64*

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඇල , |
| *නැගෙනහිරට* | : | පාර , |
| *දකුණට* | : | පාර, |
| *බස්නාහිරට* | : | පාර. |

ඩී. ආර්. කේ. හෙන්නායක,
ප්‍රාදේශීය ලේකම්,
යටවත්ත.

02-688/2

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් එස්. එන්. කේ. සේරසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1983.08.31 වැනි දින ප්‍රතිරූප අත්සන් කරන ලද අංක මාතලේ/ප්‍ර/1737 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන උකුවෙල, වරකාමුර, දෙහිපිටිය, වරකාමුර බී ජනපදය අංක 04 හි පදිංචි මොහොම්මදු කාසීම් අබ්දුල් රහීම් වෙත නිකුත් නොකර මෙම කාර්යාලයේ රඳවාගෙන ඇති මාතලේ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර නොමැති, පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූල හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.03.19 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ මාතලේ මැදසිය පත්තුවේ වරකාමුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වරකාමුර නමැති ගමේ පිහිටා ඇත්තාවූද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 54/3/2(අයි 20/5) දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක පි. පි. මා. 661 දරන පිඹුරෙහි අංක 04 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර්/අක්කර 0.085 ක් විශාලත්වය ඇත්තාවූ ද පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම-

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 03 සහ ගම්සභා පාර , |
| *නැගෙනහිරට* | : | ගම්සභා පාර , |
| *දකුණට* | : | පොල්ගහමුලවත්ත (පුද්ගලික ඉඩම), |
| *බස්නාහිරට* | : | කැබලි අංක 03 සහ පොල්ගහමුල-වත්ත (පුද්ගලික ඉඩම). |

එස්. එන්. කේ. සේරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
උකුවෙල.

2020 අගෝස්තු මස 28 වැනි දින.

02-688/3

## ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, මාතලේ දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් මාදුවගේ යුරේෂ් නිශාන්ත වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1997.04.25 වැනි ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/ගලේ/3657 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන දේවහුව, දඩුබැදිරුප්ප, තලාකොළයාය පදිංචි හේරත් මුදියන්සේලාගේ රණසිංහ වෙත ප්‍රදානය කොට ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම ඇති අයෙකු සිටිය ද ඔහු /ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.03.19 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

### උපලේඛනය

මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දපල්ල කෝරළේ දඩුබැදිරුප්ප ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ප්‍රමාණයෙන් රූඩ් 03, ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද දමුණගහමුලයාය නමැති රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ඩබ්. ඒ. ආනන්ද රූපසිංහගේ ඉඩම, |
| නැගෙනහිරට | : | ඩබ්. ආර්. ලයනල්ගේ ඉඩම, |
| *දකුණට* | : | එම්. පී. කරුණාරත්නගේ ඉඩම, |
| *බස්නාහිරට* | : | ඩබ්. ඒ. පොඩිනෝරිස්ගේ ඉඩම . |

එම්. යූ. නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
ගලේවෙල.

2020 මාර්තු මස 11 වැනි දින.

02-688/4

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

මධ්‍යම පළාත් සභාවේ, මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් හේරත් මුදියන්සේලාගේ නිශාන්ත දිනිප්‍රිය වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1997 ජනවාරි මස 06 වැනි ප්‍රදානය කර ඇති අංක මධ්‍යම/රත්/654 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අංක 23, ලෝන්විල්වත්ත, මරදුරාවල, රත්තොට මාතලේ, පදිංචි උල්පැන් ගෙදර රත්මැණිකේ මහත්මිය වෙත ප්‍රදානය කොට දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක මධ්‍යම/රත්/654//3650/97 යටතේ 1997.06.10 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව විරෝධතාවයක් ඇත්නම් එය 2021.03.19 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

මාතලේ පරිපාලන දිස්ත්‍රික්කයේ රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මාතලේ පල්ලේසිය පත්තුවේ ලෝන්විල් ග්‍රාම නිලධාරි වසමේ මරදුරාවල නමැති ගමේ පිහිටා ඇත්තාවූද, මාතලේ මිනින්දෝරු අධිකාරි භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 48/19/4 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක මු. පි. මා 1081 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 23 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.126ක් වූ විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම් කට්ටිය : ලෝන්විල්වත්ත ජනපදය.

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 70 , |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 70 සහ 68, |
| *දකුණට* | : | කැබලි අංක 68 |
| *බස්නාහිරට* | : | කැබලි අංක 22. |

එච්. එම්. එන්. දිනිප්‍රිය,
ප්‍රාදේශීය ලේකම්,
රත්තොට.

02-688/5

### ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කේ. එන්. කෞශල්‍යා කුමාරි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1993.12.06 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාර/8/ප්‍ර/14317 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන තාරපේරිය ගෙදර, රත්කැකුලාව පදිංචි තාරපේරිය වන්නිගමගේ ධනපාල වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO - 507 යටතේ 1994.03.17 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.03.19 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දබඩ පත්තුවේ රත්කැකුලාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ රත්කැකුලාව රංචාගොඩ නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක 39 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ.ග.පි. 97 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 838 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.212 විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ.ග.පි. 97 හි අංක 840 සහ 839 දරන බිම් කැබලි, |
| *නැගෙනහිරට* | : | අ.ග.පි. 97 හි අංක 839, 815 1/2, 815 2/2 සහ 840 දරන බිම් කැබලි , |
| *දකුණට* | : | අ.ග.පි. 97 හි අංක 840 දරන බිම් කැබැල්ල , |
| *බස්නාහිරට* | : | අ.ග.පි. 97 හි අංක 840 දරන බිම් කැබැල්ල. |

කේ. එන්. කෞශල්‍යා කුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
මුලටියන.

2020 ඔක්තෝබර් මස 19 වැනි දින.

02-571/1

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) කේ. එන්. කෞශල්‍යා කුමාරි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1998.10.07 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාර/8/ප්‍ර/40111 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන පල්ලාවෙල පදිංචි ජයසූරිය ආරච්චිගේ රංජනී වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ 1999.03.19 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.03.19 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ මුලටියන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කන්දබඩ (බටහිර) පත්තුවේ පල්ලාවෙල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පල්ලාවෙල නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 01 විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ආර්. ධනපාල යන අයගේ ප්‍රදානපත්‍ර ඉඩම, |
| *නැගෙනහිරට* | : | යූ. ඩබ්. ගුණපාල යන අයගේ ඉඩම, |
| *දකුණට* | : | රජයේ රක්ෂිතය, |
| *බස්නාහිරට* | : | උඩුගලගේ චන්ද්‍රකුමාර යන අයගේ ඉඩම. |

කේ. එන්. කෞශල්‍යා කුමාරි,
ප්‍රාදේශීය ලේකම්,
මුලටියන.

2020 ජූලි මස 15 වැනි දින.

02-571/2

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් තුෂාරි පී. සූරියආරච්චි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1983.07.06 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර/7082 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන වැල්ලාන පදිංචි ලේනදුව ලොකුගේ සරදියස් අප්පු වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක LDO 322 යටතේ 1984.08.26 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැතිවීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.03.19 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිගම් කෝරළේ වැල්ලාන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වැල්ලාන නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල්වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක පී. පී. 13683 දරන පිඹුරේ අංක 20 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට අත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 01, රූඩ් 0, පර්. 09 විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩමඃ කොට්ටනුවේහේන.

| | | |
|---|---|---|
| *උතුරට* | : | පී. පී. 13683 හි 19 කැබැල්ල සහ ටී. පී. 362918, |
| *නැගෙනහිරට* | : | පී. පී. 13683 හි 21 කැබැල්ල, |
| *දකුණට* | : | පී. පී. 13683 හි 18 කැබැල්ල, |
| *බස්නාහිරට* | : | පී. පී. 13683 හි 31, 19 කැබැල්ල. |

තුෂාරි පී. සූරියආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
වැලිපිටිය.

2018 ඔක්තෝබර් මස 22 වැනි දින.

02-571/3

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් තුෂාරි පී. සූරියආරච්චි වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.09.30 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාර/14/ප්‍ර/36702 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන කනංකෙ කඩවිදිය, පුහුලහේන පදිංචි නීලා යමන් සීටින් වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක ඩී 25/330 යටතේ 1996.12.06 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනාපත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2021.03.19 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිගම කෝරළේ පුහුලහේන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පුහුලහේන නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 3ක් විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම: පුහුලහේන.

| | | |
|---|---|---|
| උතුරට | : | ජී. එම්. පොඩි මහතාගේ රජයේ ඉඩම, |
| නැගෙනහිරට | : | එච්. වයි. ආතර් සිල්වාගේ රජයේ ඉඩම, |
| දකුණට | : | වයි. ඩබ්ලිව්. කුලතුංගගේ රජයේ ඉඩම, |
| බස්නාහිරට | : | ආරියවතී වික්‍රමරත්නගේ රජයේ ඉඩම. |

තුෂාරි පී. සූරියආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
වැලිපිටිය.

2020 සැප්තැම්බර් මස 21 වැනි දින.

02-571/4

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් ඕ. වී. චන්දන තිලකරත්න වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1986.02.18 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර 10646 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන අකුරැස්ස, ගංහැල, අන්නාසිගලහේන පදිංචි ගල්ලත් ගොඩගේ වසන්ත අනුර කුමාර වෙත ප්‍රදානය කොට මාතර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක D 9/316 යටතේ 1992.11.08 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධයක් ඇත්නම් එය 2021.03.19 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැලිගම් කෝරළේ ගංහැල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ගංහැල නමැති ගමේ පිහිටා ඇති, සර්වේයර් ජනරාල් වරයා විසින් සාදනු ලැබ, ඔහු භාරයේ ඇති අංක අ. ග. පි. 543 දරන පිඹුරෙහි අංක 287 දරන බිම් කැබැල්ල වශයෙන් නිරූපණය කර ඇති ප්‍රමාණයෙන් අක්. 01, රූඩ් 0, පර්. 14ක් ඇතැයි ගණන් බලා තිබෙන අන්නාසිවලහේන යනුවෙන් හඳුන්වනු ලබන පහත සඳහන් පරිදි මායිම් වූ රජයේ ඉඩම් කට්ටිය.

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ.ග.පි. 543 හි 288, 289, 286 කැබලි, |
| *නැගෙනහිරට* | : | අ.ග.පි. 543 හි 286, 302 කැබලි, |
| *දකුණට* | : | අ.ග.පි. 543 හි 302, 299 කැබලි, |
| *බස්නාහිරට* | : | අ.ග.පි. 543 හි 299, 292 කැබලි. |

ඕ. වී. චන්දන තිලකරත්න,
ප්‍රාදේශීය ලේකම්,
අකුරැස්ස.

2020 සැප්තැම්බර් මස 23 වැනි දින.

02-571/5

**ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි**

දකුණු පළාත් සභාවේ, මාතර දිස්ත්‍රික්කයේ, කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්) ගනේෂ අමරසිංහ වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1982.02.23 වැනි දින ප්‍රදානය කර ඇති අංක මාතර/ප්‍ර 962 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු මොරවක (දූනට පැලවත්ත) පදිංචි ගුණසේකර විජේසිංහ වෙත ප්‍රදානය කොට කොටපොල දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 14 යටතේ 1992.02.05 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත් වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කර ගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවක් ඇත්නම් එය 2021.03.19 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතු ය.

උපලේඛනය

මාතර පරිපාලන දිස්ත්‍රික්කයේ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මොරවක පත්තුවේ/කෝරළේ මොරවක (දූනට පැලවත්ත) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මොරවක (දූනට පැලවත්ත) නමැති ගමේ පිහිටා ඇත්තාවූ ද, සර්වේ ජනරාල් වරයා භාරයේ ඇති සහ සර්වේ ජනරාල් වරයා විසින් සම්පාදිත අංක 08 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි/සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ. ග. පි. 4-40 දරන කට්ටි කැබීමේ පිඹුරේ/ අංක 432 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් රූඩ් 02, පර්චස් 14ක් විශාලත්වයෙන් ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද, රජයේ ඉඩම : කරදකැටියහේනඃ

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ.ග.පි. 4 - 40 හි අංක 431 කැබැල්ල, |
| *නැගෙනහිරට* | : | අ.ග.පි. 4 -40 හි අංක 431 කැබැල්ල, |
| *දකුණට* | : | ප්‍රවේශ මාර්ගය, |
| *බස්නාහිරට* | : | ප්‍රවේශ මාර්ගය. |

ගනේෂ අමරසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්
(අන්තර් පළාත්),
කොටපොල.

2020 නොවැම්බර් මස 11 වැනි දින.

02-571/6

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/42975.
පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය :NCP/PLC/L5/II/ කැබි/දීකා.

**21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි**

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 18, කැබිතිගොල්ලෑව ග්‍රාම නිලධාරි වසමේ කැබිතිගොල්ලෑව ගමේ සංවර්ධන සහකාර විසින් සකසන ලද දළ අනුරේඛනයේ දක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 16.95 ක්වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | පොලීසිය ඉදිරිපිට පදවිපාර රක්ෂිතය ; |
| *නැගෙනහිරට* | : | අතුරු පාර රක්ෂිතය; |
| *දකුණට* | : | එස්. පී. සී. අප්පුහාමිට අයත් ඉඩම ; |
| *බටහිරට* | : | එල්. ජේ. එම්. සිල්වාට අයත් ඉඩම. |

02. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ) බදු කාලය :* අවුරුදු තිහයි (30) (2019.11.15 දින සිට වසර 30ක් ඉදිරියට)

*වාර්ෂික බදු මුදල* .- 2019 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත, එම වර්ෂයේ ඉඩමේ වෙළඳපල වටිනාකමින් 2%කි. 2019 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වඩා වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ බදු මුදලට 20% ක් එකතු විය යුතු ය;

*වාර මුදල*.- වාර මුදලක් අය නොකෙරේ.

*(ආ)* බදු ගන්නන් විසින් බද්ද ඇරඹුන දින සිට අවුරුදු 01ක් ඇතුළත දී ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි මෙකී ඉඩම සංවර්ධනය කළ යුතු ය;

*(ඇ)* බදු ගන්නන් විසින් මෙකී ඉඩම වාණිජ කටයුතු සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඈ)* ප්‍රාදේශීය ලේකම්/ස්කෝපින් කමිටුව/ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඉ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(ඊ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බදු දීම අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* 2019.11.15 දින සිට අවුරුදු 05ක අවම කාලයක් ඉක්මවීමට කලින් අතුරු බදු දීම් කළ නොහැක.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ කළ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ඩබ්. එම්. එස්. ජී. කරුණාරත්න,<br>
සහකාර ඉඩම් කොමසාරිස්,<br>
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2021 පෙබරවාරි මස 25 වැනි දින,<br>
''මිහිකත මැදුර'', ඉඩම් මහලේකම් කාර්යාලය,<br>
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි,<br>
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-572

---

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/58620.<br>
ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්)ගේ අංකය :<br>
අම්/නිඉකො/දීබ/7/3.

## 21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

අම්පාර දිස්ත්‍රික්කයේ, අම්පාර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් සේනානායකපුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ සේනානායකපුර ගමේ කඩයිම් සිතියම් 280007 හි කැබලි අංක 628 වශයෙන් දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0055ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ල වාණිජ පදනමින් හේවා බැට්ටගේ චමින්ද ලංකා ජයරත්න මයා විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

02. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත දැක්වේ:

**කැබලි අංක 628,**

| | | |
|---|---|---|
| *උතුරට* | : | කැබලි අංක 627 ; |
| *නැගෙනහිරට* | : | කැබලි අංක 21 (06 වන පෙදෙස) ; |
| *දකුණට* | : | කැබලි අංක 629 ; |
| *බටහිරට* | : | පීපී. අම්. 750 හි කැබලි අංක 37. |

ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ)* *බදු කාලය* : අවුරුදු තිහයි (30) (ගරු ඇමතිතුමා අනුමත කළ 2020.02.04 දින සිට ඉදිරියට)

(ආ) *වාර්ෂික බදු මුදල* .- 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපල වටිනාකමින් 2%කි. 2020 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) ට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ වෙළඳපොල වටිනාකමින් 4%කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අයකළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතු ය;

*වාර මුදල*.- වාර මුදලක් අය නොකෙරේ.

*(ඇ)* මෙම ඉඩම වාණිජ කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතු ය;

*(ඈ)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළත දී පළාත් ඉඩම් කොමසාරිස්/ඉඩම් කොමසාරිස් (අන්තර් පළාත්)/ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතු ය.

*(ඉ)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් සහ අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසි වලට ද මෙම බද්ද යටත් විය යුතු ය;

*(ඊ)* සාදා ඇති/සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය;

*(උ)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබාගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ;

*(උ)* බද්ද ක්‍රියාත්මක වන දින සිට වසර 05ක් ගත වන තුරු අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ)* බදු කුලිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හිදී ගිවිසුම ඉබේට ම අහෝසි වනු ඇත.

මෙම නිවේදනය පළ වූ දින සිට සති 06ක් ඇතුළත දී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

සමීර පී. හෙට්ටිආරච්චි,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2021 පෙබරවාරි මස 25 වැනි දින,
අංක 1200/6, ඉඩම් මහලේකම් කාර්යාලය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර, බත්තරමුල්ල හි පිහිටි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

02-613

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.